// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2121/31 - 2019 අප්‍රේල් මස 30 වැනි අඟහරුවාදා - 2019.04.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ප්‍රා. ලේ. ගොනු අංකය*: DST/LND/1/ACQ/55.
*ඉඩම් අමාත්‍යාංශයේ ගොනු අංකය*: LD/5/2009/PC/196.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශ්‍යතාව ලබාගැනීමට රජය අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

කදුරුපොකුණ ග්‍රාමෝදය සෞඛ්‍ය මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශ්‍යතාවේ විස්තර:*

දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කදුරුපොකුණ ගමේ කදුරුපොකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අවසාන ගම් පිඹුරු අංක 311, අතිරේක අංක 20, පත්‍ර අංක 20 හා 2018.06.26 දිනැති මූලික පිඹුරෙහි කැබලි අංක 474 වශයෙන් සඳහන් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0389 ක් පමණ වන මුගුණගහවත්ත නමැති ඉඩම.

කැබලි අංකය 474

ඉඩමේ නම: මුගුණගහවත්ත; ඉඩමේ විස්තරය: ගෙවත්ත ස්ථිර ගොඩනැගිල්ලක් සහ මිශ්‍ර භෝග වගාවක් ඇත; හිමිකම කියන අය: කුමාරසිංහ වන්නිආරච්චිගේ විල්සන්, 31/7 බෝධි මාවත, තංගල්ල; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0389.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තමතමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2019 ජුනි මස 26 වැනි දින පෙ.ව. 10.00 ට තංගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2019.06.19 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාව ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල් ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ප්‍රාදේශීය ලේකම්,
තංගල්ල.

2019 අප්‍රේල් මස 24 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

05-254

1A - G 29965 - 27 (2019/04)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: 8/3/5/3/10.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: 4-3/9/2017/WS/313.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර:*

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොහොන්සිය පත්තුව සුළු කොට්ඨාසයේ, දියබුබුල කොට්ඨාස අංක 6 - දුම්රියපොළ පෙදෙස - මාතලේ මහ නගර සභා සීමාව තුළ පිහිටි සර්වේයර් ජනරාල් විසින් මැන සකස් කරන ලද අංක මා/1772 මූලික පිඹුරේ කැබලි අංක 1 සිට 5 වශයෙන් දැක්වෙන මුළු ප්‍රමාණය හෙක්. 0.1409 ක් වූ පහත දැක්වෙන ඉඩම් කොටස් සඳහා මායිම්:

**කැබලි අංකය 1 – ඉඩමේ නම - වරිපනම් අංක 25 නාගොල්ල පාර - ප්‍රමාණය: හෙක්ටයාර් 0.0018 - මුල් හිමිකම් පාන්නා සොයා ගත නොහැක.**

*උතුරට*: මූපිමා 1735 හා කැබලි අංක 21, මූ.පි 1127 හි කැබලි අංක F54 සහ මෙම පිඹුරේ කැබලි අංක 3; *නැගෙනහිරට*: කැබලි අංක 3 සහ 2; *දකුණට*: කැබලි අංක 2 සහ මූ.පි. 1127 හා කැබලි අංක F54; *බටහිරට*: මූපිමා 1735 හි කැබලි අංක 22 සහ 21.

**කැබලි අංකය 2 – ඉඩමේ නම - වරිපනම් අංක 25 නාගොල්ල පාර - ප්‍රමාණය: හෙක්ටයාර් 0.1207 - ඉඩම් විස්තර ලැයිස්තුව සොයා ගත නොහැකි බැවින් මුල් හිමිකම් පාන්නා තහවුරු කර ගත නොහැක. සිරපුඩීන් රජීනා උම්මා සහ බදුර්නිසා රජීක් විසින් භුක්ති විඳී.**

*උතුරට*: මූපි 1127හි F54 සහ මෙම පිඹුරේ කැබලි අංක 3; *නැගෙනහිරට*: කැබලි අංක 3, 4 සහ 5; *දකුණට*: මූපි 1841 හි කැබලි අංක 5916 සහ මූපි 1127 හි කැබලි අංක F54; *බටහිරට*: මූපි 1127 හි කැබලි අංක F54 සහ මෙම පිඹුරේ කැබලි අංක 1.

**කැබලි අංකය 3 – ඉඩමේ නම - වරිපනම් අංක 25 නාගොල්ල පාර - ප්‍රමාණය: හෙක්ටයාර් 0.0062 - ඉඩම් විස්තර ලැයිස්තුව සොයා ගත නොහැකි බැවින් මුල් හිමිකම් පාන්නා තහවුරු කර ගත නොහැක. සිරපුඩීන් රජීනා උම්මා සහ බදුර්නිසා රජීක් විසින් භුක්ති විඳී.**

*උතුරට*: මූපි 1127හි කැබලි අංක F54; *නැගෙනහිරට*: මූපි 4801 හි කැබලි අංක 12918, මෙම පිඹුරේ කැබලි අංක 4, 5 සහ 2; *දකුණට*: කැබලි අංක 5 සහ 2; *බටහිරට*: කැබලි අංක 2, 1 සහ මූපි 1127 හි කැබලි අංක F54.

**කැබලි අංකය 4 – ඉඩමේ නම - වරිපනම් අංක 25 නාගොල්ල පාර - ප්‍රමාණය: හෙක්ටයාර් 0.0006 - රජීනා උම්මා සහ බදුර්නිසා රජීක් විසින් අනවසරයෙන් භුක්ති විඳී.**

*උතුරට*: මූපි 4801හි කැබලි අංක 12918; *නැගෙනහිරට*: මූපි 4801 හි කැබලි අංක 12918, මූපි 1841 හි කැබලි අංක 5916 සහ මෙම පිඹුරේ කැබලි අංක 5; *දකුණට*: මෙම පිඹුරේ කැබලි අංක 5; *බටහිරට*: කැබලි අංක 5, 2 සහ 3.

**කැබලි අංකය 5 – ඉඩමේ නම - වරිපනම් අංක 25 නාගොල්ල පාර - ප්‍රමාණය: හෙක්ටයාර් 0.0116 - රජීනා උම්මා සහ බදුර්නිසා රජීක් විසින් අනවසරයෙන් භුක්ති විඳී.**

*උතුරට*: කැබලි අංක 2, 3 සහ 4; *නැගෙනහිරට*: කැබලි අංක 4 සහ මූපි 1841 හි කැබලි අංක 5916; *දකුණට*: මූපි 1841 හි කැබලි අංක 5916; *බටහිරට*: මූපි 1127 හි කැබලි අංක F54 සහ මෙම පිඹුරේ කැබලි අංක 2.

ඉහත සඳහන් ඉඩම් සඳහා හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තමතමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2019 මැයි මස 29 වැනි දින පූර්ව භාග 10.00ට මාතලේ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2019 මැයි මස 22 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල් ගණින් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

කේ. පී. කේ. එල්. පී. මධුවන්ති,
ප්‍රාදේශීය ලේකම්,
මාතලේ.

2019 අප්‍රේල් මස 24 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
මාතලේ.

05-255

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.